(නවවැනි පාර්ලිමේන්තුව - පස්වැනි සභාවාරය)

අංක **46.** ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2024** අගෝස්තු **21** බදාදා පූ.භා. **9.30** ට

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **අජිත් රාජපක්ෂ මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

---

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **ටිරාන් අලස් මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **ජීවන් තොන්ඩමන් මහතා,** ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා,** වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **ඩග්ලස් දේවානන්දා මහතා,** ධීවර අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** කර්මාන්ත අමාත්‍යතුමා සහ සෞඛ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් ප්‍රනාන්දු මහතා,** වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය,** සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සිසිර ජයකොඩි මහතා,** දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** අධිකරණ හා බන්ධනාගාර කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියල් නිශාන්ත ද සිල්වා මහතා,** ධීවර රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රෝහණ දිසානායක මහතා,** ක්‍රීඩා හා යෞවන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනූප පස්කුවල් මහතා,** සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජගත් පුෂ්පකුමාර මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන්දික ප්‍රනාන්දු මහතා,** නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක ප්‍රියන්ත මහතා,** ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශාන්ත බණ්ඩාර මහතා,** ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරක බාලසූරිය මහතා,** විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සුරේන් රාඝවන් මහතා,** උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** පළාත් සභා, පළාත් පාලන සහ පරිසර රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එස්. වියාලේන්ද්‍රන් මහතා,** වෙළඳ සහ පරිසර රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** තාක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**

ගරු **නීතිඥ තලතා අතුකෝරල මහත්මිය**

ගරු **සම්පත් අතුකෝරල මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **වජිර අබේවර්ධන මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **මායාදුන්න චින්තක අමල් මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු **(ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා**

ගරු **ලලිත් එල්ලාවල මහතා**

ගරු **ගෝවින්දන් කරුණාකරම් මහතා**

ගරු **ගයන්ත කරුණාතිලක මහතා**

ගරු **නීතිඥ සාගර කාරියවසම් මහතා**

ගරු **ෆයිසාල් කාසිම් මහතා**

ගරු **නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**

ගරු නීතිඥ උදයන කිරිඳිගොඩ මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු වීරසේන ගමගේ මහතා

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ඉම්රාන් මහරුෆ් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු නීතිඥ එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු නීතිඥ අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු රොෂාන් රණසිංහ මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු එම්. රාමේෂ්වරන් මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු නයන වාසලතිලක මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු නීතිඥ මධුර විතානගේ මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු ජගත් සමරවික්‍රම මහතා

ගරු ජයන්ත සමරවීර මහතා

**ගරු  මෛත්‍රීපාල සිරිසේන මහතා**

**ගරු  එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු  ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**

**ගරු  නීතිඥ ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා**

**ගරු  නීතිඥ රවුෆ් හකීම් මහතා**

**ගරු  එච්. එම්. එම්. හරීස් මහතා**

**ගරු  කබීර් හෂීම් මහතා**

**ගරු  ඒ. එච්. එම්. ෆවුසි මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

හංස අබේරත්න මහතා,  සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස් විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. අභිනව මන්ත්‍රීවරයන්ගේ නිල ප්‍රතිඥාව හෝ දිවුරුම:** ගාල්ල මැතිවරණ කොට්ඨාසයේ පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා නීති ප්‍රකාර ප්‍රතිඥා දී සභා මේසය මත තබා ඇති පොතෙහි අත්සන් කළේ ය.

**2. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

I

"සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ගරු හරීන් ප්‍රනාන්දු මහතා සහ ගරු මනුෂ නානායක්කාර මහතා එම පක්ෂයෙන් පහ කිරීමට එරෙහිව ඔවුන් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට ගොනු කරන ලද පෙත්සම්, 2024 අගෝස්තු 09 දින ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙන ලද තීන්දු ප්‍රකාරව නිෂ්ප්‍රභ කර ඇති බැවින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99(13)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, 2024 අගෝස්තු 09 දින සිට මෙම පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධුර දෙකක පුරප්පාඩු ඇති වූ බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි."

II

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, මා විසින් 2024 අගෝස්තු 09 දින 'ආර්ථික පරිවර්තන' නමැති  පනත් කෙටුම්පතෙහි හා 2024 අගෝස්තු 15 දින 'වෛද්‍යා (සංශෝධන)' නමැති  පනත් කෙටුම්පත් දෙකෙහි සහතික සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

III

" 'පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන)' නමැති පනත් කෙටුම්පත සලකා බැලීම පිණිස පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 113(2) ප්‍රකාරව, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට මතු පළවන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් අතිරේක සාමාජික මන්ත්‍රීවරයන් වශයෙන් මා විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි:-

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා"

IV

" 'පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන)' නමැති පනත් කෙටුම්පත සලකා බැලීම පිණිස පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 113(2) ප්‍රකාරව, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට මතු පළවන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් අතිරේක සාමාජික මන්ත්‍රීවරයන් වශයෙන් ම'විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි:-

ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු කංචන විජේසේකර මහතා

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු රෝහණ දිසානායක මහතා

ගරු අනුරාධ ජයරත්න මහතා

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා"

**3. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව —

(i) 2021 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ XLI කොටස;

(ii) 2022 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ තෙවැනි කාණ්ඩයේ XIX කොටස සහ නවවැනි කාණ්ඩයේ XXXVII කොටස; සහ

(iii) 2023 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ IV සහ V කොටස්, තෙවැනි කාණ්ඩයේ I කොටස සහ නවවැනි කාණ්ඩයේ I කොටස ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(2) කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2023 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ VII කොටස, සිව්වැනි කාණ්ඩයේ I කොටස සහ පස්වැනි කාණ්ඩයේ I කොටස ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(3) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා ශීර්ෂය 04 - උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් —

(i) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2023 වර්ෂය සඳහා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් —

(i) 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 44 වගන්තිය සමඟ කියවිය යුතු 71 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා මහ බැංකුව විමසා කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට සිදු කරගෙන යන අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන්, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 ජූලි 26 දිනැති අංක 2394/66 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(ii) 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 45 වගන්තිය සමඟ කියවිය යුතු 71 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විමසා සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ එකඟත්වය ඇතිව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට සිදු කරගෙන යන අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන්, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 ජූලි 26 දිනැති අංක 2394/67 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(iii) 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 ජූලි 18 දිනැති අංක 2393/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි; සහ

(iv) 2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනතේ 11 වගන්තිය සමඟ කියවිය යුතු 17 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 අප්‍රේල් 30 දිනැති අංක 2382/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග

ඉදිරිපත් කර, එම නියෝග සහ රෙගුලාසි රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 124(6) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් මානව හිමිකම් උල්ලංඝනයවීම්, බරපතල ගණයේ ජාත්‍යන්තර මානුෂීය නීති කඩකිරීම් සහ වෙනත් එවැනි බරපතල වැරදි පිළිබඳව විමර්ශනය කිරීම සඳහා පූර්වගාමීව පත් කරන ලද පරීක්ෂණ කොමිෂන් සභා සහ කමිටු මඟින් සොයා ගන්නා ලද කරුණු සහ ඒවායේ නිර්දේශ පිළිබඳව විමර්ශනය කිරීම සහ පරීක්ෂා කිරීම, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ වාර්තා කිරීම සඳහා පත් කරන ලද ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ අවසන් වාර්තාව (I වැනි වෙළුම) ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(9) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් —

(i) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(ii) 2022 වර්ෂය සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය;

(iii) 2022 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ වාර්ෂික වාර්තාව; සහ

(iv) 2023 වර්ෂය සඳහා කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා හා ගිණුම් අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(10) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(11) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ පාර්ලිමේන්තුවේ විපක්ෂනායක කාර්යාලය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(12) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව පරිසරය, ස්වාභාවික සම්පත් හා තිරසර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(13) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2017 වර්ෂය සඳහා ලංකා ධීවර සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව ආහාර සුරක්ෂිතතාව හා කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(14) ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(15) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(16) කර්මාන්ත අමාත්‍ය සහ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් 2021/2022 වර්ෂය සඳහා කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් හි වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(17) කර්මාන්ත අමාත්‍ය සහ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් —

(i) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2022 වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල සහ පශ්චාත් වෛද්‍ය උපාධි පුහුණු මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා සෞඛ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(18) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින්—

(i) 2022 වර්ෂය සඳහා ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(19) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**4. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** (1) ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ සභාපති, නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ මහතා විසින් "සත්‍ය ශ්‍රී ගණපති භක්ති ජන සේවා පදනම (සංස්ථාගත කිරීමේ)" නමැති පනත් කෙටුම්පත පිළිබඳ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ වාර්තාව හා එහි කාර්ය සටහන් ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

පනත් කෙටුම්පත ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව විසින් වාර්තා කරනු ලැබූ පරිදි 2024 සැප්තැම්බර් 03 අඟහරුවාදා සලකා බැලිය යුතු ය.

(2) ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ සභාපති, නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ මහතා විසින් "ශ්‍රී ලංකා සැලසුම් තාක්ෂණඥයින්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ)" නමැති පනත් කෙටුම්පත පිළිබඳ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ වාර්තාව හා එහි කාර්ය සටහන් ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

පනත් කෙටුම්පත ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව විසින් වාර්තා කරනු ලැබූ පරිදි 2024 සැප්තැම්බර් 03 අඟහරුවාදා සලකා බැලිය යුතු ය.

(3) ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ සභාපති, නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ මහතා විසින් "පළාත් සභා මැතිවරණ (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත පිළිබඳ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ වාර්තාව හා එහි කාර්ය සටහන් ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

පනත් කෙටුම්පත ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව විසින් වාර්තා කරනු ලැබූ පරිදි 2024 සැප්තැම්බර් 03 අඟහරුවාදා සලකා බැලිය යුතු ය.

(4) යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති, ගරු නීතිඥ ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා විසින් එකී කාරක සභාව වෙත යොමු කරන ලද 2022 වර්ෂය සඳහා ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(5) යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති, ගරු නීතිඥ ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා විසින් එකී කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත; සහ

(ii) විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත් කෙටුම්පත

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(6) ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාවේ සභාපති, ගරු පාඨලී චම්පික රණවක මහතා විසින් නවවැනි පාර්ලිමේන්තුවේ පස්වැනි සභාවාරය සඳහා ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාවේ තෙවැනි වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(7) ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති, ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා වෙනුවෙන් එම කාරක සභාවේ සාමාජික මන්ත්‍රී, ගරු නීතිඥ මධුර විතානගේ මහතා විසින් එකී කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(ii) 2019, 2020, 2021 සහ 2022 වර්ෂ සඳහා ලෝහෝර් ආර්යා ණය අරමුදලේ වාර්ෂික වාර්තා;

(iii) 2019, 2020, 2021 සහ 2022 වර්ෂ සඳහා ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තා;

(iv) 2021 සහ 2022 වර්ෂ සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තා;

(v) 2020 සහ 2021 වර්ෂ සඳහා ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තා; සහ

(vi) 2020 සහ 2021 වර්ෂ සඳහා සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ වාර්ෂික වාර්තා

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(8) රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා වෙනුවෙන් එම කාරක සභාවේ සාමාජික මන්ත්‍රී, ගරු පාඨලී චම්පික රණවක මහතා විසින් එකී කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය; සහ

(ii) 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියෝග

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(9) පරිසරය, ස්වාභාවික සම්පත් හා තිරසර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති, ගරු අජිත් මාන්නප්පෙරුම මහතා විසින් එකී කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) 2022 වර්ෂය සඳහා මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ සහ අභ්‍යාස ආයතනයේ වාර්ෂික වාර්තාව;

(ii) 2022 වර්ෂය සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ

(iii) 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම්

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(10) පරිසරය, ස්වාභාවික සම්පත් හා තිරසර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති, ගරු අජිත් මාන්නප්පෙරුම මහතා විසින් එකී කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) 2023 වර්ෂය සඳහා පරිසර අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(ii) 2021 වර්ෂය සඳහා ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්; සහ

(iii) 2023 වර්ෂය සඳහා ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(11) විවෘත හා වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති, ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා විසින් එකී කාරක සභාව වෙත යොමු කරන ලද ආගමන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**5. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) ගම්පොළ, හැරකොළ, අංක 116 දරන ස්ථානයෙහි පදිංචි ජේ. වී. ජී. විජේසූරිය මහතාගෙන් ලැබුණු 2024.07.06 දිනැති පෙත්සම ගරු අනුරාධ ජයරත්න මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) නැගෙනහිර නයිනමඩම, තොටුපල හන්දිය, "හවුස් ඩොරීන්" යන ලිපිනයෙහි පදිංචි ඒ.ඩී. ස්වර්ණා පෙරේරා මහත්මියගෙන් ලැබුණු 2024.07.05 දිනැති පෙත්සම;සහ

(ii) අම්බලන්ගොඩ, කළුවඩුමුල්ල, ගාමිණී විද්‍යාල මාවත, අංක 12, දරන ස්ථානයෙහි පදිංචි අමාශා නිර්මාණි එදිරිමුණි මහත්මියගෙන් ලැබුණු 2024.07.12 දිනැති පෙත්සම

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා විසින් පිළිගන්වන ලදී.

(3) කළුතර දකුණ, ජෝන් වීදිය, අංක 72/35 දරන ස්ථානයෙහි පදිංචි එම්.එම්. මින්නාස් මහතාගෙන් ලැබුණු 2024.07.03 දිනැති පෙත්සම ගරු එස්. එම්. මරික්කාර් මහතා විසින් පිළිගන්වන ලදී.

(4) නින්දාන, ගොඩමාවත, ෆිනැන්ස් වත්ත යන ලිපිනයෙහි පදිංචි චතුදූර අයරින් මහත්මියගෙන් ලැබුණු 2024.06.02 දිනැති පෙත්සම ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා විසින් පිළිගන්වන ලදී.

(5) (i) ඉපලෝගම, පහළ වෙම්බු වැව, පන්සල ඉදිරිපිට, "මානෙල්" යන ලිපිනයෙහි පදිංචි බී.එම්.එල්. රත්නසිරි මහතාගෙන් ලැබුණු 2024.05.20 දිනැති පෙත්සම; සහ

(ii) ගලෙන්බිඳුනුවැව, නාමල්පුර, මහමීගස්වැව යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්. එම්. කේ. එස්. වනසිංහ මහතාගෙන් ලැබුණු 2024.07.14 දිනැති පෙත්සම

ගරු වීරසේන ගමගේ මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරනු ලැබේ.

**6. රාජ්‍ය වත්කම් කළමනාකරණ:** මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් පිළිගැන්වූ පනත් කෙටුම්පත,— කොම්ප්ට්‍රෝලර් ජනරාල් දෙපාර්තමේන්තුව යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු සහ සඳහන් කරනු ලැබිය යුතු දෙපාර්තමේන්තුවක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; රාජ්‍ය ආයතනයක් විසින් පූර්ණ හිමිකම දරනු ලබන, පවරන ලද, අත්කරගන්නා ලද, පවරා ගන්නා ලද, දරන ලද හෝ උපයෝජනය කරන ලද මූල්‍ය නොවන නිශ්චල හෝ චංචල වත්කම් හඳුනා ගැනීම සහ එම වත්කම්වල ජාතික වත්කම් ලේඛනයක් සම්පාදනය කිරීම සඳහා ද; එකී ලේඛනය කලින් කලට යාවත්කාලීන කිරීම සඳහා සහ එකී වත්කම්වල නිසි ප්‍රතිලාභ රාජ්‍ය ආයතන වෙත ලැබීම තහවුරු කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2024 සැප්තැම්බර් 04 බදාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**7. දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන):** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් පිළිගැන්වූ පනත් කෙටුම්පත,— (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2024 සැප්තැම්බර් 04 බදාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**8. අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන):** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් පිළිගැන්වූ පනත් කෙටුම්පත,— 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2024 සැප්තැම්බර් 04 බදාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**9. ගෙවල් කුලී (ඉවත් කිරීමේ):** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් පිළිගැන්වූ පනත් කෙටුම්පත,— 1972 අංක 7 දරන ගෙවල් කුලී පනත ඉවත් කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2024 සැප්තැම්බර් 04 බදාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**10. පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ:** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් පිළිගැන්වූ පනත් කෙටුම්පත,— ගෙහිමියෙකු විසින් පරිශ්‍රයක පදිංචි වී සිටින තැනැත්තන් නෙරපීම වැළැක්වීම පිණිස ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2024 සැප්තැම්බර් 04 බදාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**11. විනිමය පත්‍ර (සංශෝධන):** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් පිළිගැන්වූ පනත් කෙටුම්පත,— (82 වන අධිකාරය වූ) විනිමය පත්‍ර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2024 සැප්තැම්බර් 04 බදාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**12. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1):** ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය, ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"(140 වන අධිකාරය වූ) මාතෘ ප්‍රතිලාභ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ඒ අනුව, පනත් කෙටුම්පත පළමුවර කියවා මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52(6) ප්‍රකාරව වාර්තා කිරීම සඳහා පනත් කෙටුම්පත කම්කරු හා විදේශ රැකියා අමාත්‍යවරයා වෙත යොමු කරන ලදී.

**13. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2):** ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය, ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"(129 වන අධිකාරය වූ) සාප්පු සහ කාර්යාල සේවක (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ඒ අනුව, පනත් කෙටුම්පත පළමුවර කියවා මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52(6) ප්‍රකාරව වාර්තා කිරීම සඳහා පනත් කෙටුම්පත කම්කරු හා විදේශ රැකියා අමාත්‍යවරයා වෙත යොමු කරන ලදී.

**14. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 3):** ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා, ගරු මයන්ත දිසානායක මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී ලංකා දෘෂ්ටි විශේෂඥයන්ගේ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ඒ අනුව, පනත් කෙටුම්පත පළමුවර කියවා මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52(6) ප්‍රකාරව වාර්තා කිරීම සඳහා පනත් කෙටුම්පත සෞඛ්‍ය අමාත්‍යවරයා වෙත යොමු කරන ලදී.

**15. පාර්ලිමේන්තුවේ රැස්වීම්:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— අද දින විසිර යැමේදී මෙම පාර්ලිමේන්තුව 2024 සැප්තැම්බර් 03 අඟහරුවාදා පූ.භා. 9.30 වනතෙක් කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**16. සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය:** අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 25 වගන්තිය සමඟ කියවිය යුතු 32 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 ජනවාරි 12 දිනැති අංක 2366/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.07.12 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 02/2024 දරන සුරාබදු නිවේදනය)

(පූ.භා. 11.44ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.00ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

"ගරු නීතිඥ උදයන කිරිඳිගොඩ මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි ගරු ගයන්ත කරුණාතිලක මහතා, ගරු මුජිබුර් රහුමාන් මහතා ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 1.32ට ගරු නීතිඥ උදයන කිරිඳිගොඩ මහතා මූලාසනාරූඪ විය.)

"ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.25ට ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 3.46ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**17. කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියෝග:** අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 27, 28 සහ 45 වගන්ති සමඟ කියවිය යුතු 71 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විමසා සහ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලයේ එකඟත්වය ඇතිව, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 ජූනි 06 දිනැති අංක 2387/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.07.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**18. වර්ල්ඩ් ලයිෆ් ලයින් යෝගා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත:** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය"යි නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනිවර කියවන ලදින්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 53(3) යටතේ නියෝජ්‍ය කථානායකවරයා විසින් ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට පවරන ලදී.

**19. කල් තැබීම**: ''මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය''යි නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; ඒ අනුව, අ.භා. 3.53ට නියෝජ්‍ය කථානායකවරයා විසින් අද දින සභා සම්මතිය අනුව පාර්ලිමේන්තුව 2024 සැප්තැම්බර් 03 අඟහරුවාදා පූ.භා. 9.30 වනතෙක් කල් තබන ලදී.